# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 6 දරන

# නීති අධ්‍යාපන සභා (සංශෝධන)

# පනත

[සහතිකය සටහන් කළේ 1974 මාර්තු මස 14 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1974 මාර්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 6 දරන නීති අධ්‍යාපන සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 මාර්තු මස 14 වන දින]

ඇල්. ඩී.—ඕ. 71/73.

නීති අධ්‍යාපන සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 6 දරන නීති අධ්‍යාපන සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන නීති අධ්‍යාපන සභා ආඥාපනතෙහි 2 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම ආඥාපනතෙහි 2අ වන වගන්තිය වශයෙන් බල පවත්වන්නේ ය :— 2අ වන අලුත් වගන්තිය 276 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.

"සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ සංයුතිය.

2අ. (1) 2 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයෙහි සිට සංස්ථාගත නීති අධ්‍යාපන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :—

(අ) සභාවේ සභාපති විය යුතු, අග්‍ර විනිශ්චය කාරවරයා;

(ආ) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) නීතිපතිවරයා ; සහ

(ඈ) නීති වෘත්තියෙහි කීර්තිධර තැනැත්තන් අතුරෙන් හෝ අධිකරණ ධුර දරන හෝ දැරූ හෝ නීතිය උගැන්වීමෙහි හෝ නීති පර්යේෂණ කටයුතුවල යෙදී සිටින්නා වූ හෝ යෙදී සිටි හෝ නීතිය පිළිබඳ ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ඇත්තා වූ හෝ නීති ඥානාභිවර්ධනයට සේවයක් ඉටුකර ඇත්තා වූ හෝ තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් තැනැත්තන් සිව් දෙනෙක්.

(2) පත් කළ සෑම සාමාජිකයෙක්ම, මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ ඔහු සිය ධුරය කලින් හිස් කළහොත් මිස, තමාගේ පත්වීමෙහි දිනයෙහි සිට අවුරුදු තුනක කාලයක් ධුරය දරන අතර නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය :

ජ – 04751 –13,762 (74/2)

එසේ වුව ද, පත් කළ සාමාජිකයකුගේ ධුරයෙහි පුරප්පාඩුවක් පිරවීමට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයකු ඔහු අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලසීමාව තුළ ධුරය දැරිය යුත්තේ ය.

(3) කවර පත් කළ සාමාජිකයකුට වුව ද අමාත්‍ය වරයා වෙත ලිපියක් යැවීමෙන් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) යම් පත් කළ සාමාජිකයකු රෝගාතුරවීමේ හෝ වෙනත් දුබලතාවක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හෝ හේතුවෙන් ස්වකීය ධුරයෙහි කාර්ය ඉටුකිරීමට අපොහොසත් වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි විධිවිධාන ගැන සැලකිලිමත්ව, එම සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීමට නියි සුදුසු තැනැත්තකු පත් කළ හැකි ය.

(5) සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සභාවේ සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(6) සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා වූ යම් දෝෂයක් හෝ ඇත ද සභාවට ක්‍රියා කරගෙන යා හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(2) එම වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියෙහි " සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් " යන වචන වල සිට " නීත්‍යනුකූල වන්නේ ය. " යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :—

" සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින්, පහත සඳහන් කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් සඳහා අවශ්‍ය බව එම සභාවට පෙනී යන යම් යම් අතුරු ව්‍යවස්ථා, රීති හා නියමයන් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. ".

(3) එම වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) සභාව විසින් සාදන ලද සෑම අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ අවස්ථාවෝචිත පරිදි එම අතුරු ව්‍යවස්ථාවෙහි, රීතියෙහි නැතහොත් නියමයෙහි සඳහන් කරනු ලබන ඊට පසු දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) සභාව විසින් සාදන ලද සෑම අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියමයක් එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව ඉදිරියෙහි තැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියමයක් එහි අනනුමතියේ දිනයේ සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියමයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.".

*7අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියෙහි 7අ වන වගන්තිය වශයෙන් බල පවත්වන්නේ ය :—

*"සභාව සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.*

7අ. සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ කාර්යයන් ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ පොදු ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල එම සභාවට ලියවිල්ලකින් විධාන කළ හැකි අතර සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8, 9, 10 සහ 11 වන වගන්ති ඉවත් කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8, 9, 10 සහ 11 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.